සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** කාලය පැය 01 යි.

| නම/ විභාග අංකය: |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. අනුහසට උඩගෙඩි දෙන සිරිදාස ගම්මුන්ගේ අවඥාවට ලක්විය.
(1) ලාභ සත්කාර ගෙන දෙන (2) පසිඹින ව සලකන
(3) බැණ වදින (4) විනාශයක් කරන

02. ජනපනේ හාංගෙන සිටි මිතුරා තම මවට ආගන්න සිද්ධිය හෙළි කළේ ය.
(1) සංග්‍රහශීලී (2) සමඟෙස් බෙදා ගනිමින් (3) සමීප ඇසුරෙන් (4) අරපිරිමැස්මෙන්

03. එම ව්‍යාපෘතිය කරගෙන යන අතර අධ්‍යක්ෂවරයාගේ කුර පෑරීම නායගේ විමසුමට ලක් විය.
(1) විරුද්ධ වීම (2) මඟහැරීම
(3) හොඳින් සහාය වීම (4) උපදෙස් දීම

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. විවිධ ජන කොටස්වල ................................................ රචක ජන සමාජය සකස් වේ.
(1) සංකලනයෙන් (2) ගහණයෙන් (3) සම්මුතියෙන් (4) එකාගත්වයෙන්

05. ඉදිරිපත් කිරීමට නියමිත කරුණය වඩාත් හොඳින් ................................................ කිරීමට වඩාත් උචිත මාධ්‍යයක් තෝරා ගත යුතු ය.
(1) අවධානය (2) අවධාරණය (3) සම්ප්‍රේෂණය (4) නිර්ණය

06. සහෘදයා තුළ චමත්කාරය ................................................ වන පරිදි කරන ලද ලිඛිත නිර්මාණ සාහිත්‍යයට අයත් ය.
(1) ජනනය (2) හීන (3) තක්සේරු (4) ව්‍යාප්ත

07. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) විලෝකනය, විශ්ලේෂණ, වින්දනය, විමුක්තිය
(2) පුරුෂාර්ථ, පුනරුක්ති, පුහුදුන්, පුදසුන
(3) ආවේගය, ආකාරය, අවාසිසි, අවාරශ
(4) මානවිය, මාධික, මාහැඟී, මැද්හත්

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) නිශ්පාදන, වර්තමාන, තිළිණ ප්‍රදානය, මද්‍යසාර
(2) ළයාන්විත, ජනශ්‍රැතා, කණගාටුව, දෘෂ්ටිගෝචර
(3) කාර්යභාරය, ජාතිහිතෛෂී, නෛතික, විස්මයජනක
(4) ප්‍රතිකාර්ය, සමස්තය, ජනගහනය, හසළන්වය

09. එක් එක් වචනයෙහි මුල් අකුරෙහි දීර්ඝ ඇදය, දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, ගැටපිල්ල පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
(1) කාවඩි, සූළඟ, ශාන්ත, බෞද්ධ (2) වැවර, රූපක, නායක, තෘෂ්ණාව
(3) නැවත්, නුපත්, දාරක, පෞෂ (4) නෑදෑයෝ, නුදුරෙහි, වැස්ස, මෘදු

10. "වැව්දිය" යන වචනය අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) අව්‍යය සමාසයට ය.

11. "මාර්ගෝපදේශකවරු තාක්ෂණික උපකරණ අවභාවිතය නිසා නොමග යන දරුවන් සුමඟට ගනිති."
මෙම වාක්‍යයෙහි කර්ම පදය වන්නේ,

(1) දරුවන් ය. (2) මාර්ගෝපදේශකවරු ය.
(3) තාක්ෂණික උපකරණ ය. (4) අවභාවිතය ය.

12. "අත්තෙනි" යන පදයේ ප්‍රකෘතිය වන්නේ,

(1) අත්තේ (2) අත්ත (3) අත් (4) අතු

13. අපි ගංවතුරෙන් අසරණ වූවන්ට පාසල් උපකරණ බෙදා දුන්නෙමු. මෙම වාක්‍යයෙහි "අසරණ වූවන්ට" යන්න අයත් වන විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය. (2) ප්‍රථමා විභක්තිය (3) කර්ම විභක්තිය (4) සම්ප්‍රදාන විභක්තිය

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන පිළිතුර තෝරන්න.

14. බොහෝ දුරට **චිරන්තන** හෙළ සාහිත්‍යයේ භාෂා ශෛලිය විචාරක අවධානයට යොමු වේ.

(1) පුරාතන (2) නූතන (3) අද්‍යතන (4) සාම්ප්‍රදායික

15. එම **අවශේෂවල** ස්වරූපය සැලකිල්ලට ගත් විට මැටියෙන් තැනූ මූර්ති තිබූ බව පැහැදිලි ය.

(1) අඩුපාඩු සහිත කොටස් (2) ඉතිරි වූ කොටස්
(3) අවම කොටස් (4) විසිරුණු කොටස්

16. නිර්මාණකරණයේ නිරත වෙමින් ලබා ගන්නා **ප්‍රාගුණ්‍ය** අගනා නිර්මාණ එළිදැක්වීමට හේතු වේ.

(1) ගණනය කිරීම (2) ප්‍රමාණ කිරීම (3) ප්‍රගුණ කිරීම (4) අත්දැකීම

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) සර්ව නාම - තෝ, මම, නුඹ, මොවුහු (2) තද්ධිත - මාධුර්ය, දුවමය, ධාර්මික, වකුටු
(3) උපසර්ග - අනු, ඉ, අ, වන් (4) කෘදන්ත - නටන්නා, ලියූ, ගැයීම, සිනාසෙන

18. උක්ත පද දෙකක් ද අනුක්ත පද දෙකක් ද ඇතුළත් වරණය තෝරන්න.

(1) තෝ, බමුණෙකු, පර්වතයෝ, දරුවන්
(2) ගොප, සතුරන්, ගායිකාවක, සක්ව
(3) වෙදනාවෝ, නායකයෙක්, මැණිකයෝ, අප
(4) නිවේදිකාවක, ඇලෙනකු, වීරවරු, රිතීන්

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) පැන - ප්‍රශ්න, පතිත - වැටුණු, වුවනත - මුහුණ, කැල - සමූහය,
(2) අනූන - බොහෝ, සාමග්‍රිය - සමගිය, පයරුත් - ප්‍රකාශාර්ථ, නොලසා - ඉක්මනින්
(3) ජන්මලාභය - උපත, ලපලු - ළාදලු, තෙළෙස් - දහතුන, ඉඳු - සවීර
(4) අකෘතඥ - කළගුණ නොදත්, නුනුවණ - දැනුමැති, ශ්වේත - සුදු, පිළිවහා - වළක්වා

20. දිවේ මුල කොටස උගුර දෙසට ළං වීමෙන් උපදින ශබ්ද හඳුන්වන නම කුමක් ද?

(1) කණ්ඨජ (2) දන්තජ (3) ඕෂ්ඨජ (4) තාලුජ

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් සහිත වරණය තෝරන්න.

(1) අසාරුප්පය - අනුපයුක්ත (2) බහුල - විරල
(3) අනුචිත - නුසුදුසු (4) අවම - අධම

22. ව්‍යාපාර කටයුතු **කරා වී** අධික ලාභ **ලබද්දී** ඔවුහු පින්කම් **කරමින්** ජීවිතය යහපත් **කරගත්හ.**
ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියාපද වර්ග අනුපිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.

(1) මිශ්‍රක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(2) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

23. වැරදි අදහස දෙන වාක්‍ය තෝරන්න.
    (1) "දීඝ" ස්වර යනු ගුරු ස්වරවලට කියන තවත් නමකි.
    (2) අන්තඃස්ථාක්ෂරයක් වන "ව" අක්ෂරය ඕෂ්ඨජ අක්ෂරයක් ද වේ.
    (3) "ගොන්ගේ" යන්නෙහි අර්ථය "හරක් බාන" යන්නයි
    (4) දැම්බුරු යනු අව්‍ය සමාසයට උදාහරණයකි

24. ද්විත්ව රූප සන්ධියට උදාහරණයක් නොවන්නේ කුමක් ද?
    (1) උග්ගත් (2) මල්පුරා (3) පුත්තා (4) අතින්නෙක

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි කෙටිකතා සංග්‍රහ නාමය තෝරන්න.
    (1) රැක්පුනත්තපය (2) තරඅණය (3) පවබපිබිරන (4) සිහිමිනගනොමත

- අංක 26 , 27 යටතේ දී ඇති අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. බරපතළ අමාරුවක වැටුණා
    (1) අලතොළ මිමින තොළ වගෙයි (2) අන්තිම ඉත්තත් පදිනවා
    (3) අම්මා දුක් රන්සිරි මතක් වුණා (4) අහසට ඉනිමං බඳිනවා වගෙයි

27. යම් වැඩක් සීනැවට එපාවට කරනවා
    (1) වැල යන අතට මැස්ස ගහනවා (2) ලෙඩ කලුමෙටා වැල ගිලිනවා වගේ
    (3) ලිහා බැලූ මල්ල ඔබා බලන්නේ මොනවට ද? (4) බල්ලාට ලෙලි පොල් දුන්නා වගේ

28. A අතිශයෝක්ති - අතිශය + උක්ති
    B වාලිකාංගණය - වැලිමළුව
    C වහල්ලු - හෙන්රි ජයසේන
    D සුභාෂිතය - සීතාවක යුගය
    ABCD ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ
    (1) A හා C පමණි (2) B හා C පමණි (3) A, B හා C පමණි (4) A, B හා D පමණි

- අංක 29 සහ 30 යන ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) අපි ගුණදහම් රැකිය යුත්තෙමු
    (2) අලි ඇතුන් ගමට පැමිණෙතියි ඔවුන් බිය වූහ.
    (3) අක්කා යෙහෙළියක සමඟ පාඩම් කළහ.
    (4) මව්වරුන් සහ පියවරු ඉදිරි වැඩ පිළිවෙළවල් සම්බන්ධ ව සාකච්ඡා කළහ.

30. (1) බිසව නොමෝ ස්නානය පිණිස පිටත් වූහ.
    (2) ඔවුන් සමඟ මම ද චාරිකාව සඳහා සහභාගි වීමි
    (3) අප සියල්ලෝ ම බෞද්ධයෝ වෙති
    (4) ළමයි මවපිය අණට කීකරු නොවන්නේ ඇයි?

31. 1. **අනේ** පුතුනි, ඔබ ඒ ගමන නොයන්න
    2. ඔහු ඒ රහස දැන ගත්තා**ලු**
    3. එදින වැසි දිනයක් **නිසා** බොහෝ දෙනෙක් පාසලට නොපැමිණියහ.
    4. ඔබ **නැවත** ඒ ගමන යා යුතු ය

    ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත නිපාත පදවල අර්ථය දක්වෙන අනුපිළිවෙළ කුමක් ද?

    A - පුනරාර්ථය B - ශ්‍රැති පුවතාර්ථය
    C - භාවාර්ථය D - හේත්වර්ථය

    1. C, A, D, B 2. A, D, C, B 3. C, B, D, A 4. B, C, A, D

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
    "ඔවුනු ගෙදර යනවිට මං වැට අද්දරට වී බලා සිටියා"
    (1) ඔවුන් ගෙදර යද්දී මම වැට අයිනට වී බලා සිටියෙමි.
    (2) ඔවුහු ගෙදර යද්දී මම වැට අයිනට වී බලා සිටියහ.
    (3) ඔවුහු ගෙදර යද්දී මං වැට අයිනට වී බලා සිටියහ.
    (4) ඔවුන් ගෙදර යද්දී මා වැට අයිනට වී බලා සිටියෙමි.

33. මහගම සේකර මහතා විසින් රචනා කරන ලද කෘතියක් නොවන්නේ කුමක් ද?

(1) මක් නිසා ද යත් (2) රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත

(3) සක්වා ලිහිණි (4) සැරුමක්කාරයෝ

34. උපමාවක් සහිත කවි පදය තෝරන්න.

(1) විදුලි රත් සෙමර බඳ රන් දද සසල (2) මැණිකෙගෙ මුහුණ දකුමට පෝර කනවාලු

(3) සුරත් තඹුරු පෙති පෙනෙතින් (4) පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් ලවට

35. මුස්ලිම්වරුන් දෙදෙනෙකු හමු වූ අවස්ථාවක "අතට අත දීමේ අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කරගනු ලබන සිරිත සිදුවෙයි. එය හඳුන්වන නාමය වන්නේ

(1) අලෙයිකුම් මුස්සලාම් (2) මුසාබහා

(3) මු ආනකා (4) අස්සලාමු අලෙයිකුම්

36. පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න.

මැනලා වී දෙකක නොලැබී මල්ලකට
දරුවෝ එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
------------------------------------------------

(1) ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට (2) තාත්තා දුනන මෙනුවර තති වුණු අපට

(3) චන්දෝ කිළින්දෝ නාඩා නැළවෙන්ට (4) ඇහුවා මගෙ පුතේ කිරි බීනැද උඹට

37. " සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුන් වඩින් සියලු දිසින් සැදෙත් සැදෙත් ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත් ..........................................................

මෙම ගද්‍ය කොටස අයත් කෘතියේ කතුවරයා කවුද?

(1) විද්‍යා චක්‍රවර්ති (2) ගුරුළුගෝමී (3) ධර්මසේන හිමි (4) දෙව පතිරාජ හිමි

38. පතල් භාෂාවේ "සන්නම්" යනුවෙන් හඳුන්වන්නේ,

(1) ගල් කැට සහිත පස් තට්ටුව ය. (2) ලී තට්ටු ය.

(3) නොවටිනා ගල් ය. (4) යැරීමෙන් පසු පතුලේ ඉතිරිවන කොටස ය.

39.
ළා තඹපත් ලියලන සඳ
දඹ රත්රන් කැටයමක් ය
ඒ තඹපත් මෝරන මඳ
පලා පැහැය මහිමයක් ය

ළා සුළඟට සැලෙන ළ පලු
ඇසට කනට ගීතයක් ය
මී දේ දුව ඉසට නැගුව
ඉඳු නිල් මිණි යෝසනක් ය

යන කවියෙන් කියවෙන්නේ

(1) පලතුරක් පිළිබඳ ව ය. (2) බෝ ශාකය පිළිබඳ

(3) ස්වර්ණාභරණයක් පිළිබඳ (4) ඉඳුනිල් මැණික ගැන

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

" පෞරාණික අනුරාධපුර නගරයේ පුරා වස්තු ආරක්ෂා කර ගැනීමත් පූජනීය නගරයක් වශයෙන් එහි ශුද්ධත්වය රැක ගැනීමත් උදෙසා නිවාස, විදුහල්, වෙළඳපළවල්, අනාගාමික ගොඩනැගිලි ආදිය ශුද්ධ නගරයෙන් ඉවත් කොට නවීන නාගරික වුවමනාවන් පිරිමසාලන නව නගරයක් මල්වතු ඔයේ නැගෙනහිර ඉවුරෙහි ගොඩනගා තිබේ.

(1) අනුරාධපුර නගරයේ සාදා තිබූ නිවාස, විදුහල්, වෙළඳපළවල්, අනාගාමික ගොඩනැගිලි ඉන් ඉවත් කර මල්වතු ඔයේ නැගෙනහිර ඉවුරෙහි ඒවා නැවත ඉදිකර තිබේ.

(2) පෞරාණික අනුරාධපුර නගරයේ ඓතිහාසික වටිනාකම ආරක්ෂා කර ගැනීමට හැකි වී ඇත්තේ එහි තිබූ නවීන නාගරික ගොඩනැගිලි ඉන් ඉවත්කර වෙනත් තැනකට ගෙනයාම නිසාය.

(3) පෞරාණික නගරවල පුරාවස්තු ආරක්ෂා කර ගැනීමෙන් පූජනීය නගරයක් වශයෙන් ශුද්ධත්වය ආරක්ෂා කර ගැනීමටත් නිවාස, විදුහල් වෙළඳපලවල් අනාගාමික ගොඩනැගිලි ශුද්ධ නගරයේ ඉවත් කළ යුතු ය.

(4) අනුරාධපුර නගරයේ පුරාවස්තු ආරක්ෂා කර ගැනීමටත් පූජනීය නගරයක් ලෙස රැකගැනීමෙන් නාගරික වුවමනාවන් පිරිමසාලන නිවාස, විදුහල්, වෙළඳපළවල්, අනාගාමික ගොඩනැගිලි ශුද්ධ නගරයෙන් ඉවත් කර මල්වතු ඔය අසල ඉදිකර තිබේ.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

---

- අංක (i) සිට (x) දක්වා ඇති සියලු ම ප්‍රශ්න සඳහා කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) සිංහල හෝඩියේ ඇතුළත්

(අ) විසර්ජනීය (ආ) අනුස්වාරය

යන අක්ෂර ලියන්න.

(ii) පහත පද සන්ධි කර ලියන්න.

(අ) තැවී + ආව (ආ) අත් + ලස්

(iii) පහත වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.

අවස්ථෝචිත උපමා භාවිතා කිරිම ද රිද්මයානුකූල පද සංඝටනය ද පැරණි කවිවල බොහෝ විට දැකිය හැකි ලක්ෂණයකි.

(iv) පහත පද්‍ය පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

බඩ වක පිට වක සත් වැරටිල්ලා
දෙපටට කුඩු ගැසී වකට සැඩුල්ලා

(v) පහත වාක්‍යයේ ඇතුළත් උපසර්ග දෙක උපුටා ලියන්න.

මහ වනයේ ඇති හොඳින් වැඩුණු සුවිශාල වෘක්ෂයෝ සොබා දහමට නිහඬ මෙහෙයක් සිදු කරති.

(vi) පරිමිත භාෂාවල එන පහත පදවල අර්ථ ලියන්න.

(අ) බූවා (ආ) කුටාලම

(vii) පහත වාක්‍ය සදොස් නම් නිදොස් කරන්න.

(අ) ශිෂ්‍යයෝ ශිෂ්‍යාවෝ සමඟ තරග වදිති

(ආ) අධ්‍යක්ෂවරයා නොහොත් නියෝජිතවරිය රැස්වීමට සහභාගි වන්නේ ය.

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) නර්තන ශිල්පීහු විශිෂ්ට නර්තන අංගයකින් සභාව පිනවති

(ආ) මවුහු එදින මා අධිකරණය වෙත කැඳවූහ.

(ix) පහත වාක්‍යයේ තද කළු අකුරින් දී ඇති පදවල විභක්තිය නම් කරන්න.

උපාසිකාව විලෙන් නෙළුම්මල් නෙළා බුදුපුන මත පුදයි.

(x) පහත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කරන්න.

(අ) නැටුම් (2) පොඩිති (ලකුණු 2 x 10 = 20)

02 පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ජාතික හා ජාත්‍යන්තර සමගිය පිළිබඳ ව අද ලෝක ප්‍රජාවගේ අවධානය යොමු වී ඇත. ජාතික සමගිය ඇති කිරීමේ මූලික පියවර වන්නේ පවුලේ සමගිය ඇති කිරීමයි. නමුත් අද බොහෝ පවුල් තුළ එවා සමගියක් ඇති බවක් නොපෙනේ. දෙමවුපිය - දූදරු සබඳතා දුරස්ථ වී පවතී තරගකාරී ආර්ථික හා සමාජ රටාව තුළ එදා මෙන් දෙමාපියන් හා දරුවන් අතර සුහද ව කතා කිරීමේ අවස්ථාව ගිලිහී ඇත. ජාතික සමගිය කරා යන ගමනේ දී පවුලේ සමගිය රඳවා ගැනීම උදෙසා දෙමාපියන්ගේත් දරුවන්ගේත් කාර්යභාරය ඉතා විශාලය.

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිවල කඩිනම් සංවර්ධනයක් දක්නට ලැබේ. අධිවේගී මාර්ග තැනීම, අබලන් මාර්ග ප්‍රතිසංස්කරණය මෙහි දී වැදගත් වේ.

නමුත් දිනෙන් දින ඉහළ යන රිය අනතුරුවලට හේතුව මෙකී සංවර්ධනය බවට සමහරු මැසිවිලි නඟති. එහෙත් සමහරුන්ගේ මතය අබලන් මාර්ග නිසා රිය අනතුරු සිදු වන බවයි. රියදුරන්ගේ නොසැලකිලිමත්කම ඇතුළු බොහෝ රිය අනතුරුවලට හේතු වෙයි. විනයගරුක රියදුරන් බිහි කිරීමට අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.

(ඇ) විනයගරුක සංයමයෙන් යුතු, නිරෝගී මිනිසුන් බිහි කිරීමට ක්‍රීඩාව තුළින් ලැබෙන්නේ මහත් පිටුබලයකි. පෙරපාසල් වියේ පටන් ක්‍රියාශීලී දරුවන් තැනීමට විවිධ ක්‍රියාකාරකම් හා වැඩ සටහන් සකස් කළ යුතු ය. ඒවා ලියකියවිලිවලට පමණක් සීමා නොකර ක්‍රියාත්මක කරමින් අදාළ අරමුණු ඉටු කර ගැනෙන පරිදි යොදා ගත යුතු ය. පාසල ඊට හොඳ ම තෝතැන්න වේ. විනෝදාස්වාදය ලැබීමට පමණක් ක්‍රීඩාව යොදා නොගතයුතු ය.

(ඈ) අපි ස්වාභාවික විපත් පිළිබඳ ව නිතර කතා කරන අවධියක සිටිමු. ඒවාට අදාළ හේතු කාරණා දිගින් දිගට සාකච්ඡාවට බඳුන් වුව ද මිනිසා තවමත් ස්වභාව ධර්මයට එරෙහිව කටයුතු කරයි. මෙවන් වකවානුවක ආපදා කළමනාකරණය පිළිබඳ අවධානය යොමු වීම අත්‍යවශ්‍ය කරුණකි.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 60 - 70 අතර වන සේ සාරාංශ කරන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

" පාසල් ජීවිතයෙන් පසු පුද්ගලයකු පිවිසෙන්නේ වඩා සංකීර්ණවූත් ගැටලු සහිතවූත් පොදු සමාජයට හෙවත් සැබෑ ජීවිතයටයි. එහි දී ගෙදරදීත් පාසලේදීත් ගත කළ ජීවිතයට වඩා වෙනස් දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වෙයි. තමාට වඩා උගතුන් ද නූගතුන් ද වැඩිහිටියන් ද බාලයන් ද දුප්පතුන් ද පොහොසතුන් ද ආදී විවිධ තරාතිරම්වල පුද්ගලයන් සමඟ කටයුතු කිරීමට සිදු වේ. ඔවුනගේ සිතුම් පැතුම් හා හැසිරීම් ද අමුතු ය. මේ හැම දෙනා සමඟ එක්ව ජීවත් වීමට ගන්නා උත්සාහයේ දී පෞද්ගලිකත්වයට විවිධ ගුණාංග රාශියක් එකතු වෙයි.

විවිධ ස්ථාන අවස්ථා සිද්ධි හා පුද්ගලයන් සමඟ උචිත ලෙස හැසිරීමටත් පරිසරයට වහල් නො වී මධ්‍යස්ථ ව යහපත අයහපත විනිශ්චය කර ගැනීමටත් තරම් මේරූ තත්ත්වයකින් සමාජයට එන පුද්ගලයකුට සමාජය ප්‍රියමනාප තැනක් කොටගෙන. යහතින් ජීවත් වෙමින් තම ස්වීයත්වය පරිණතියට පත්කර ගැනීමට නො හැකි වෙයි. නො එසේ ම නො මේරූ තත්ත්වයෙන් එන පුද්ගලයාට සමාජය තේරුම් ගත නො හැකි ව විවිධ බල වේගයන් සමඟ ඒ මේ අතට ඇදී යන්නට සිදු වී පරිසරයේ ගිලී යන්නටත්, අතරමං වීමටත්, සමාජ විරෝධියකු වන්නටත් සිදු වීම නො වැළැක්විය හැකි ය. පොදු සමාජය දෙස බලන විට බොහෝ වැඩිහිටියන් පවා ළමයින් මෙන් බොළඳ ලෙස හැසිරෙන අවස්ථා දක්නට ලැබෙනුයේ ඔවුනගේ පෞරුෂත්ව වර්ධනය වී නැති හෙයිනි. යහතින් කියතොත් පොදු සමාජයේ උචිත හැසිරීම් දැක්වීමට හැකිවීම පරිණත ස්වීයත්වය ලෙස හැඳින්විය හැකි ය."

(ලකුණු 10)

04 පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

" මිනිසා මුල් යුගයේ දී ලෝහ ආයුධ නිපදවා ගත්තේ උල් කළ ගල් කැබලි ආදියෙන් දඩයම් කිරීමේ දී මතු වූ ගැටලුවලට පිළියමක් වශයෙනි. ලෝක යුද්ධයේ අභියෝගය ඉදිරියේ මතු ගුවන් නැව, පරමාණු බෝම්බය වැනි දෑ නිපදවීය. අධ්‍යාපන තාක්ෂණය විෂය සම්බන්ධයෙන් ද ඉහත සඳහන් කළ සිද්ධාන්තය ම සත්‍යයක් වශයෙන් වලංගු වෙයි. මිනිසා නව දැනුම් හා ක්‍රමවේද සොයා යාමට පෙළඹුණේ ඔහුට මුහුණ පෑමට සිදු වූ යම් යම් අභියෝගයනට පිළියම් වශයෙනි. අධ්‍යාපන තාක්ෂණය බිහි වූයේ ද තත්කාලීන සමාජ අවශ්‍යතා ප්‍රමාණවත් අන්දමින් සපුරාලීමට සාම්ප්‍රදායික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළ ගොනු වී පැවති දැනුම ප්‍රමාණවත් නොවූ හෙයිනි. අනුරාධපුර හෝ පොළොන්නරු යුගයේ ශිෂ්‍යයකු විසින් ලද අධ්‍යාපනය වත්මන් යුගයේ සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හෝ අදාළ හෝ නොවේ. ජීවිතය යනු නිරන්තර පරිණාම ක්‍රියාවලියක එක් අංගයක් පමණකි. එහෙයින් එය සෑම විට ම වෙනස් වෙමින් අඛණ්ඩ ප්‍රවාහයක් මෙන් කාලය ඔස්සේ ගලා බසිමින් පවතී. මේ නිසා පවත්නා දැනුම හා ශිල්පීය ක්‍රම යල් පැන යාමත්, නව දැනුම ඉපයීමත් නිරතුරු ව සිදුවෙමින් පවතී."

(i) අධ්‍යාපන තාක්ෂණය බිහි වූයේ ඇයි?

(ii) නොකඩවා ම සිදු වන තත්ත්වයන් දෙකක් ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද?

(iii) මිනිසා ලෝහ ආයුධ නිෂ්පාදනය කෙරෙහි යොමු වූයේ ඇයි?

(iv) ජීවිතය පිළිබඳව මෙහි දක්වා ඇති අර්ථකථනය කුමක් ද?

(v) ලෝක යුද්ධය අභියෝගයක් වූ තැනදී මිනිසා විසින් නිෂ්පාදිත මෙවලම් දෙකක් ලෙස මෙහි දක්වා ඇත්තේ මොනවා ද? (ල. 10)

05. විවිධ හේතු නිසා ඇති වී තිබෙන වකුගඩු රෝගය සම්බන්ධයෙන් ජනතා අවධානය යොමු කරලීම පිණිස " වකුගඩු රෝග නිවාරණ බලකාය" මගින් නිකුත් කෙරෙන පත්‍රිකාවක් පිළියෙල කරන්න.

නැතහොත්

ආසන්න දිනයක දී තිස්සවැව ප්‍රදේශයේ ඇති වූ සුළිසුළං තත්ත්වයක් හේතුවෙන් නිවාස 200 කට පමණ හානි සිදු විය. ඒ හේතුවෙන් ප්‍රදේශවාසීන් ලක්ව ඇත්තේ දැඩි දුෂ්කරතාවන්ට ය. ඒවා විස්තර කරමින් ඉක්මනින් සහන සැලැස්වන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සංවර්ධන නිලධාරින් වෙත යැවෙන ලිපිය ලියන්න.

ඔබ තිස්ස වැව ප්‍රදේශයේ ප්‍රගති සමාජ සේවා සමිතියේ ලේකම් එච්. ඒ. සුනිල් ජයරත්න ලෙස සලකන්න.

(ල. 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. හිස්තැන් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියු වූ යුගය කුමක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නගා ඇත්තේ කුමන අයෙකුගේ අනුග්‍රහයෙන් ද?

(ii) මා කී හද් හදියැනි බොරුවක්ම — නැති
බිම එලි වුණොත් කණු මදු බොහොම ළඟ — ඇති
ඇහැට දවහෙස ඇති කුන්පමට නිදි — නැති
......................................................................

(අ) ඉහත පද්‍යයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය කුමන ජනකවි වර්ගයට අයත් ද?

(iii) (අ) සැළලිහිණි සන්දේශයෙහි රචකයා නම් කරන්න.
(ආ) සිංහල සාහිත්‍ය වංශයෙහි දක්නට ඇති පැරණිම සන්දේශ කාව්‍ය කුමක් ද?

(iv) " හේ! ඒයාට විහරක් මොක ද? මමත් ගෙට යනවා"
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) ජේ. ජයතිලකයන්ගේ මුල්ම කෙටි කතා සංග්‍රහය නම් කරන්න.

(v) දෑසේ කඳුළැලි පිහදා බිලනෙමි
හෙට හිරු එලියට වඩින දිනේ
ණයනැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ.
(අ) මෙම පද්‍ය නිර්මාණය ඇතුළත් පද්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) එම පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.

(vi) (අ) " අගුල්මල් දමනය" පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය රචනා කළ යුගය කුමක් ද?

(vii) "ඔව්, ඔයාට ඒක තේරුණේ නෑ. නේද? ආයි පැරලා නෑ පදනම එක වගේමයි.
(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කා විසින් ද?
(ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

(viii) වැහි වලාකුළු රාවු කඳු මුදුන්වල ලගින
දූන් ඒවී නැති බිමට සීතල යි මගෙ සිතට
වැසි සමේ රෑ ඇඟේ සිහිනයන් වී ඉන්න
ඔබ එන්න - ඉකිත් මගෙ හෙට දවස මට දෙන්න.
(අ) ඉහත සඳහන් පද්‍ය කොටස උපුටාගත් පද්‍ය පන්තියේ නම ලියන්න.
(ආ) මෙම පද්‍ය නිර්මාණය කළ ගීත රචකයාගේ ප්‍රථම කාව්‍ය සංග්‍රහය කුමක් ද?

(ix) "පුත තෙල ලෙස නිරිම් තොපටත් අපටත් තරම් නොවෙයි."
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම මුල් කෘතිය ලිවීමට පාදක කරගත් ග්‍රන්ථය කුමක් ද?

(x) පහත සඳහන් කෘතින් හි කතුවරු නාම කරන්න.
(අ) සියබස්ලකර -
(ආ) බුත්සරණ - (ලකුණු 2 x 10 = 20)

02 පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) රුසි වනපෙති නැවිදින් <u>සුමුවේරයා</u>
නිති මියුරැති වෙණ <u>නදළමුයෝය</u>
සිහිවිලි නැගී රූ විලස <u>මුවෝය</u>
තැති නොගතිති මිනිසුන් <u>සමුවේරයා</u>

(අ) තදකළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) මුළු කවියේම අර්ථය ලියන්න.

(ii) ඉක්බිතිව උඩුගලේ පිටතට නෙරාගිය තැනකට සවිසර ඇති අත අස්කාන් මාත් අල්ලාගෙන ගල කරතටමු. එවිට තුරස්කන් ඇඟිරි සුදුපාට වැස්සක් මෙන් ගල වටේ ගැලී යයි.

(අ) මෙම පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.
(ආ) ඉහත සඳහන් පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) කස්තුරි තිලක සැදී තළලත <u>සුමටාන</u>
පුල් මහනෙල් මල්දම් හිස <u>දවටාන</u>
සලෙළුන් යනෙන නිති කැල් <u>කෙළි</u> <u>තවටාන</u>
රිවි මුදුනත වන මැද විදු <u>සුමුටාන</u>

(අ) ඇංකිත පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අර්ථය සරල බසින් ලියන්න.

(iv) සබඳ, තොප විසින් කුමක් දක්නා ලද ද, කුමක් අසන ලද ද යි විචාළ මෙක.

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කාහට ද?
(ආ) මෙම ප්‍රකාශය සඳහා ලැබෙන පිළිතුර කුමක් ද?

(v) තුමුල ගතින් දා
බාහු බෙලෙන්දා
වෙම් සේ තිදසින් දා
කුරිරු ඕපින්දා
කුඹු කල සින්දා
ලම් ශේ කෙපරින්දා

(අ) ඉහත පද්‍ය කොටසේ සිංහයා සඳහා යොදා ඇති උපමාව කුමක් ද?
(ආ) මෙම කොටසේ සමස්ත අර්ථය ලියන්න. (ලකුණු 4 x 5 = 20)

03 (i) එක් සියයක් රජ දරුවන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමටත්,
(ii) වෛදේහ රජුන්, වෛදේහ රාජ්‍යයත්, ආරක්ෂා කර ගැනීමටත්, මහෞෂධ පඬිතුමා ක්‍රියාකළ ආකාරය නිර්දිෂ්ට පාඩමෙන් උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

<u>නැතහොත්</u>

" හානාහීය පානා අඩ හැරෙන් දුනේ" ජනකවි පෙළෙන්,
(i) ජීවිත ගැටලුවලට වැදගත් වන උපදේශ ලබා දීමත්,
(ii) ජනතාවගේ සදාචාර සංවර්ධනයත් අරමුණ වී ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් පිළිතුරු සපයන්න.

04 බැද්දේගම කතුවරයා කතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණයේදී,
(i) සංවාද ආකෘතිය සාර්ථකව යොදා ගෙන ඇති ආකාරයත්,
(ii) චරිත කෙරෙහි දයානුකම්පාවක්, ඇතිවන අයුරින් උපමා උපමේයන් ගෙන සරසා ඇති අයුරුත් ප්‍රශස්තය.
නිර්දිෂ්ට පාඩමින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

<u>නැතහොත්</u>

(i) වැසිකිළිය නැතීමේ කටයුත්ත සෞඛ්‍ය පරීක්ෂකතුමා ජය ගන්නා අතර,
(ii) එය භාවිත කිරීමේ ජයග්‍රහණය ලබන්නේ හරපගායි.
" උපට වැසිකිළියක්" කෙටිකතාව ඇසුරින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- අංක **05, 06, 07** ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

05 මැටිල්ඩා ලොවිසල් මහත්මිය සාමාන්‍ය පංතියේ සමාජ පසු තලයක ඉපිද, ඉහළ ජීවන රටාවක් අපේක්ෂාවෙන් සිහින මැවූ කෙනෙකි. නිර්දිෂ්ට කෙටි කතාවෙන් උදාහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.

06 නුලං දා ඵයට ජීවය පිඹින කවියා ඒ සඳහා පරිසරයේ ඇති වූ පිබිදීම එක්කර ගනී. වස්සාන සමයෙහි බිලපෑම කවියා වර්ණනයට භාවිත කරන අයුරු උදාහරණ තුනක් දෙමින් සාකච්ඡා කරන්න.

07 " දැනෙත් කරගැට සිඟසනසන්නට " පද්‍ය නිර්මාණයේ උපයුක්ත භාෂාව නිර්මාණය රසවත් කිරීමට දායක වූ ආකාරය උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ල. 15 යි)